

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

2024

වාර්ෂික කාර්යසාධන වාර්තාව

පටුන

01.	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	01-38
02.	නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය	39-66
03.	ක්‍රීඩා වෛද්‍ය ආයතනය	67-91
04.	ජාතික ක්‍රීඩා විද්‍යායතනය	93-109



තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

01. වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

1.1 හැඳින්වීම

ක්‍රීඩාව තුලින් ජවසම්පන්න පුරවැසියෙක් හා ජයග්‍රාහී ජනතාවක් බිහි කිරීම සහ තෘප්තිමත් තාරුණ්‍යක් හා සංස්කෘතිකවත් නිවහල් චින්තනයක් නිර්මාණය කිරීමේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුකූලව තරුණ ප්‍රජාව හා ක්‍රීඩාව කේන්ද්‍ර කරගනිමින් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ කාර්යයන් සිදු කෙරේ. ක්‍රීඩා හා යෞවන කටයුතු ලෙස පැවති අමාත්‍යාංශ නාමය 2412/08-2024 දරණ හා 2024 නොවැම්බර් මස 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය.

1.2 දැක්ම මෙහෙවර

දැක්ම

‘ජවසම්පන්න තාරුණ්‍යය තුළින් තිරසර සංවර්ධිත දේශයක්’

මෙහෙවර

ජාතික ආර්ථිකයට සක්‍රියව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහිකිරීම හා විනය ගරුක, ක්‍රීඩාශීලී සමාජයක් තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟීමට දායක වීම.

1.2 ප්‍රධාන කාර්යයන්

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා තරුණ කටයුතු සහ ක්‍රීඩා විෂයන්ට සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යය භාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියළු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- රැකියා විරහිත තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා දත්ත පද්ධතියක් පිහිටුවීම, ඔවුන් ස්ථානගත කිරීම සඳහා රැකියා බැංකුවක් පිහිටුවීම සහ විරැකියාව ක්‍රමානුකූලව අවම කිරීම සඳහා මාර්ගගත වේදිකාවක් හරහා අදාළ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම

- තරුණ පරපුරේ අභිලාෂයන් ඉටු වන ජාතික වැඩපිළිවෙළක් අරමුණු කර ගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විවිධ ජාතීන් හා ආගම් අතර අවබෝධය වර්ධනය කිරීම සඳහා තරුණ හුවමාරු වැඩසටහන් නිර්මාණය කිරීම
- තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු
- තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලිත්වය සමාජ පිළිගැනීමක් ඇති වන සහ ඔවුන්ට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකි වන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම
- තරුණ ව්‍යවසායකයින් බිහි කිරීමට පියවර ගැනීම සහ ඔවුන්ට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම
- උසස් පෙළ සමත්, නමුත් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් විය නොහැකි වූ තරුණ ප්‍රජාව ඉලක්ක කර වෘත්තීය නිපුණතාවයක් සහිත තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම
- දැනටමත් මාර්ගගත ක්‍රමය ඔස්සේ විදේශ විනිමය උපයන නිදහස් වෘත්තික (Freelance) තරුණ තරුණියන්ට ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කිරීම
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටුයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා ඝානුබලයන් සැපයීම
- ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණය ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකි වන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික තරඟවලට සහභාගී වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම
- පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම
- ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේදී තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම
- ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම
- ක්‍රීඩා සමිති සංවිධාන සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම
- ක්‍රීඩා සඳහා විශේෂ දක්ෂතා ඇති ක්‍රීඩකයන් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික මට්ටම, පෝෂණය සහ පුහුණුවට අදාළ උපකරණ ලබා දීම සඳහා පාසල් සහ දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩසටහන් ක්‍රියාක්මක කිරීම

- ජාතික ක්‍රීඩා පුහුණු පාසලක් කේන්ද්‍රකොට ගනිමින් පළාත් නවය සඳහාම නවීන ක්‍රීඩා පාසල් ජාලයක් ඇති කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයන්ට අදාළ කටයුතු සහ එම සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව


1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ජාතික තරුණ සේවා සභාව
2. ජාතික යොවුන් සේනාංකය
3. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
5. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
6. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
7. උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

අරමුදල

1. ජාතික ක්‍රීඩා අරමුදල

1.4 සංවිධාන සටහන


Organization Chart of Ministry of Sports and Youth Affairs
Secretary
CFO
Add.Sec(Admin& Procurement)
Add.Sec (Youth)
Add.Sec(SIDD)
DG(Planning)
DG(Planning)
Add.Sec(Dev)
DG(Eng)
CIA
CA
SAS
D(SLAS)
SAS
D(SLAS)
CA
D(SLPS)
CIA
Director(SLPS)02
D(SLAS) 02
CE
IA
Accountant 02
AS 04
Mech anical Eng
LO
Coordi nating Sec to the Sec.
DD/AD
AS
DD/AD(SLAS)
Account
DD/AD(SLPS) 01
DD/AD(SLPS)02
DD/AD 02
LO
Eng(Civil)02
ICTO (02)
AO
Translator 02
TO 02
TO 02
DO
Informa -tion Officer
DO
DO
DO
DO
DO
DO
DO
MSO
MSO
MSO
MSO
MSO
MSO
MSO
Still Camera men
Camera men
ICTA
Camera aid
Driver
Driver
OEA
OEA
OEA
OEA
OEA
OEA
OEA
OEA

02. වන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2.1.1. සුවිශේෂී ජයග්‍රහණ

- 2024 ප්‍රංශයේ පැරිස් හි පැවති පැරාලිම්පික් තරඟාවලියේ F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් සමිත දුලාන් විසින් රිදී පදක්කම දිනා ගැනීමට සමත් විය. එමෙන්ම, ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලියේ දී F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් ලෝක වාර්තාවක් සමඟින් සමිත දුලාන් විසින් රන් පදක්කම දිනා ගැනීමට සමත් විය.



සමිත දුලාන්



එම්.ජී.නුවන් ඉන්දික

- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලියේ දී මීටර් 100 ඉසව්වෙන් එම්.ජී.නුවන් ඉන්දික විසින් ලෝකඩ පදක්කම දිනා ගැනීමට සමත් විය.



සමිත දුලාන්

- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලියේ දී යගුලිය විසිකිරීමේ ඉසව්වෙන් පාලිත බණ්ඩාර විසින් ලෝකඩ පදක්කම දිනා ගැනීමට සමත් විය.



පාලිත බණ්ඩාර

- ජෝර්දානයේ පැවති පැරාලිම්පික් ටේබල් ටෙනිස් තරඟාවලියේ දී පී.ඩී.එස්.දිනේෂ් ප්‍රියන්ත විසින් රන් පදක්කම දිනා ගැනීමට සමත් විය.
- මොරොක්කෝවේ පැවති 2024 ග්‍රෑන්ඩ් ෆික්ස් ලෝක පැරා මලල ක්‍රීඩා තරඟාවලියේ දී රන් පදක්කම් 02 ක් හා රිදී පදක්කම් 05 ක් දිනා ගැනීමට සමත් විය.
- ඩුබායි හි පැවති ග්‍රෑන්ඩ් ෆික්ස් පැරාලිම්පික් මලල ක්‍රීඩා තරඟාවලියේ දී රන් පදක්කම් 02 ක් රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.
- 21 වන ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02 ක් පදක්කමක් දිනා ගැනීමට සමත් විය.
- එක්සත් අරාබි එමීර් හි පැවති කණිෂ්ඨ ග්‍රෑන්ඩ් ෆික්ස් මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.
- 2024 ජපානයේ ඔසාකා හි පැවති මලල ක්‍රීඩා තරඟාවලියේ දී එච්.කේ.කාලිංග කුමාරගේ විසින් රන් පදක්කමක් හා ජපානයේ ටෝකියෝ හි පැවති මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කමක් දිනා ගැනීමට සමත් විය.



එච්.කේ.කාලිංග කුමාරගේ



පී.ඩී.එස්.දිනේෂ් ප්‍රියන්ත

- පළමු ආසියානු සහය දිවීමේ ශූරතාවලියේ දී පිරිමි සහය දිවීමේ කණ්ඩායම විසින් රන් පදක්කම හා කාන්තා සහය දිවීමේ කණ්ඩායම විසින් රිදී පදක්කම දිනා ගැනීමට සමත් විය.
- තායිවානයේ පැවති විවෘත මළල ක්‍රීඩා තරඟාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා තරුෂි කරුණාරත්න විසින් මීටර් 400 හා මීටර් 800 ඉසව්වෙන් රන් පදක්කම් 2 ක් දිනා ගැනීමට සමත් විය.



තරුෂි කරුණාරත්න

- චීනයේ මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් දිනා ගැනීම සමත් විය.
- 19 වන ස්පාඤ්ඤ ජාත්‍යන්තර මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා කාලිංග කුමාරගේ විසින් රිදී පදක්කමක් දිනා ගැනීමට සමත් විය.
- කොරියාවේ පැවති 2 වන ආසියානු හෙල්ල විසි කිරීමේ තරඟාවලියේ දී රන් පදක්කමක් හා ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීමට සමත් විය.
- බහමාස් හි පැවති මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් දිනා ගැනීමට සමත් විය.
- මාලදිවයිනේ පැවති 6 වන ආසියානු තරඟාවලියේ දී කාන්තා කණ්ඩායම විසින් රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02ක් දිනා ගැනීම සමත් විය.
- ඉරානයේ පැවති 32 වන ෆාජ් ජාත්‍යන්තර තරඟාවලියේ දී බැඩ්මින්ටන් ක්‍රීඩක හසිත අනුරුද්ධ විසින් හා විරේන් නෙත්තසිංහ විසින් ලෝකඩ පදක්කම් 02ක් දිනා ගැනීමට සමත් විය.
- **IFBB** ආසියානු කායවර්ධන ශූරතා තරඟාවලියේ දී රිදී පදක්කම් 03 ක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.

- ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම විසින් 2024 ආසියානු ශූරතාවය දිනා ගැනීමට සමත් විය.
- ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම විසින් නවසීලන්තය සමඟ පැවති ටෙස්ට් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීමට සමත් විය.



ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම



ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම

- තායිලන්තයේ පැවති **U** 15 **&** **U** 20 මල්ලවපොර තරඟාවලියේ දී නෙත්මි අභිංසා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.
- 20 න් පහළ කාන්තා වොලිබෝල් කණ්ඩායම විසින් අනුශූරතාවය දිනා ගැනීමට සමත් විය.



20 න් පහළ කාන්තා වොලිබෝල් කණ්ඩායම



නෙත්මි අභිංසා

- තායිලන්තයේ පැවති ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලියේ දී චාමර නුවන් ධර්මවර්ධන විසින් රන් පදක්කමක් දිනා ගැනීමට සමත් විය. එමෙන්ම ශ්‍රී ලංකා කණ්ඩායම විසින් රිදී පදක්කම් 04 ක් හා ලෝකඩ පදක්කම් 04 ක් දිනා ගැනීමට සමත් විය.

- ෆිජී හි පැවති 2024 පොදු රාජ්‍ය මණ්ඩලීය (කණිෂ්ඨ,ජ්‍යෙෂ්ඨ,තරුණ) තරඟාවලියේ දී කේ.ඒ.අශේන් සචින්ත විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.
- ලෝක කැරම් තරඟාවලිය සඳහා සහභාගී වූ කණ්ඩායම විසින් කාන්තා හා පිරිමි ඒකල කණ්ඩායම් විසින් රිදී පදක්කම් 02 ක් හා කාන්තා හා පිරිමි යුගල කණ්ඩායම් විසින් ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීමට සමත් විය.
- ශ්‍රී ලංකා කණ්ඩායම විසින් ආසියානු නෙට්බෝල් අනුශූරතාවය දිනා ගැනීමට සමත් විය.
- තායිලන්ත **ASBC** බොක්ෂිං ආසියානු ඵලයිට් පිරිමි ශූරතා තරඟාවලියේදී පසිඳු උමයංග මිහිරාජ් ක්‍රීඩකයා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.



පසිඳු උමයංග මිහිරාජ්



විරේන් වෙත්තසිංහ

- බොට්ස්වානා හි පැවති ජාත්‍යන්තර බැඩ්මින්ටන් තරඟාවලියේදී ජයග්‍රහණ ලබා ගැනීමට සමත් විය.
- බංගලාදේශයේ පැවති **Yonex Sunrise International Challenges** 2024 තරඟාවලියේදී බැඩ්මින්ටන් ක්‍රීඩක විරේන් වෙත්තසිංහ විසින් රන් පදක්කමක් හා බැඩ්මින්ටන් ක්‍රීඩිකාවන් වන ඉසුරි අත්තනායක හා සිතුමි සිල්වා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.

2.1.3. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංකය	වැඩසටහනේ නම	වෙන් කල ප්‍රතිපාදන (රු.මි.)	2022.12.31 දිනට මුල්‍ය ප්‍රගතිය (රු.මි.)	2022.12.31 දිනට මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
01	පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන ✶	1500	507	33.8%	65%

✶ ක්‍රිකට් ක්‍රීඩාව සඳහා නව පාසල් 206 ක සහ ක්‍රිකට් ක්‍රීඩාව පවතින පාසල් 67 ක පැති විකට් ඉදිකරන ලදි. එසේම ක්‍රිකට් ක්‍රීඩාව පවතින පාසල් 77ක ක්‍රිකට් ක්‍රීඩාපිටි අලුත් වැඩියාව සිදු කරන ලදි. නව පාසල් 325 කට ක්‍රිකට් උපකරණ මිලදී ගෙන ඇත.

2.2. ඉදිරි ඉලක්ක (2022 -2026)

- ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් තරුණ විරැකියාව පහත හෙළීම.
- දළ ජාතික නිෂ්පාදිතයට ක්‍රීඩා ආර්ථිකයේ දායකත්වය ඉහල නැංවීම.
- ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ ලබා ගත හැකි ක්‍රීඩා තරග සඳහා සහභාගිත්වය 25% කින් හා ඔලිම්පික් හා පොදු රාජ්‍ය මණ්ඩලීය පදක්කම් සංඛ්‍යාව 20 දක්වා වැඩි කිරීම.
- නිරෝගීමත් ජන සමාජයක් උදෙසා සෑම පුරවැසියෙක්ම ශාරීරික ක්‍රියාකාරකමකට හෝ ක්‍රීඩාවකට යොමු කිරීම.

.....

ආයතන ප්‍රධානියාගේ අත්සන

ඒ .එච්. එම්. යූ. අරුණ බණ්ඩාර
ලේකම්
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

03. වන පරිච්ඡේදය

2024.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒකීය-එක්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	2024	2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒකීය-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,659,650,000	1,611,546,000.00	ඒකීය-3
-	තැන්පතු		37,772,466	53,262,662.00	ඒකීය-4
-	අත්තිකාරම් ගිණුම්		45,089,894	40,970,274.00	ඒකීය-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,742,512,360	1,705,778,936.00	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,742,512,360	1,705,778,936.00	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		831,603	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,741,680,757	1,705,778,936.00	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,136,023,800	වැටුප්, වෙනත් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,050,570,678	903,000,077.00	
595,645,100	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	363,874,406	381,508,254.00	ඒකීය-2(ii)
3,477,405,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,724,927,565	2,389,792,587.00	
-	පොළී ගෙවීම්	8	-	-	
1,196,709	වෙනත් පුනරාවර්තන වියදම්	9	381,234	496,020.00	
5,210,270,609	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		4,139,753,883	3,674,796,938.00	
	මූලධන වියදම්				
65,374,430	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	44,881,015	33,141,711.00	
126,472,852	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	93,446,272	205,897,321.00	
2,735,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	1,450,548,038	865,946,614.00	ඒකීය-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
34,763,087	හැකියා වර්ධනය	14	26,551,325	21,413,947.00	
1,586,359,022	වෙනත් මූලධන වියදම්	15	510,185,778	158,643,874.00	
4,547,969,391	මුළු මූලධන වියදම් (උ)		2,185,612,428	1,285,043,468.00	
	තැන්පතු ගෙවීම්		66,119,883	70,436,581.00	ඒකීය-4
	අත්තිකාරම් ගෙවීම්		50,476,557	38,119,900.00	ඒකීය-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		116,596,440	108,556,481.00	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		6,441,962,750	5,068,396,887.00	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(4,700,281,993)	(3,362,617,951.00)	
	අග්‍රිම ඇලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(4,700,281,993)	(3,362,617,951.00)	ඒකීය-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒකීය-3
			(4,700,281,993)	(3,362,617,951)	

1

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,177,719,132	3,253,702,926
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	140,416,925	154,109,578
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**3,318,136,057**	**3,407,812,504**
ඉද්ධ වත්කම් / ශ්‍රකන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		80,443,467	46,709,388
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,177,719,132	3,253,702,926
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	29,000,326	48,079,642
ප්‍රංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	30,973,131.89	59,320,548
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**3,318,136,057**	**3,407,812,504**

පිටු අංක.....සිට ..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..... සිට ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් කාරකසභා 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.


ප්‍රධානී ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය :	දිනය : 25/02/22

ඒ .එච්. එම්. යූ. අරුණ බණ්ඩාර
ලේකම්
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

ඒ .එච්. එම්. යූ. අරුණ බණ්ඩාර
ලේකම්
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

Omantha Vithanachchi
Chief Accountant (Payments)
Ministry of Youth Affairs and Sports
No 09, Philip Gunawardana MW
Colombo 07

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය



එසිල්-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

තක්සා

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	119,646,361	94,135,955
අග්‍රිම ලැබීම්	1,659,650,000	1,611,546,000
අන්තිකාරම් අයකර ගැනීම්	45,662,936	37,250,575
තැන්පතු ලැබීම්	37,772,466	53,262,662
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,862,731,763	1,796,195,192
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,364,434,107	1,241,433,084
යහපාධාර සහ මාරුකිරීම්	52,538,645	30,228,878
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	2,694,035	17,769,902
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	831,603	-
අන්තිකාරම් ගෙවීම්	50,774,569	38,250,776
තැන්පතු ගෙවීම්	66,119,883	70,436,581
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,537,392,842	1,398,119,221
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	325,338,921	398,075,970
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	325,338,921	398,075,970
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූල මුදල් ප්‍රවාහය (ඉ)	325,338,921	398,075,970
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(325,338,921)	(398,075,970)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූල මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූල මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව තහවුරුකා, මුදල් ලැබෙන කාලපරිවර්තේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට නිශ්චිතභාවයක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම්වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම්" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* නම් වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

nbv

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය

(රු.,000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	4,900,000.00	5,210,270.00	4,139,753.00	79%
ප්‍රාග්ධන	4,500,000.00	4,547,969.00	2,185,611.00	48%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධන

වත්කම් නොවන	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	1,399,933,608.00	1,399,933,608.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	1,266,206,263.08	1,266,206,263.08	-	-
9153	ඉඩම්	138,000,300.00	138,000,300.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	401,120.00	401,120.00	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	373,177,840.89	373,177,840.89	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

(21)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එස්වයිඒ/ඒ/එම එස් /2/24/29 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2025 ජූනි 23 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

ශීර්ෂය 194 - තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 194 - තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 20 දින නිකුත් කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ආදායම් නොවන ලැබීම්

ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඔයලොග් ආයතනය එක්ව සමාලෝචිත වර්ෂය තුල සංවිධානය කර පවත්වා තිබූ Sri Lanka Sports Fiesta 2024 වැඩසටහන සඳහා රු.මිලියන 40 ක මුදල් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ජාතික ක්‍රීඩා අරමුදලෙන් හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලබා දී තිබුණද, එම මුදල ආදායම් නොවන ලැබීම ලෙස ගිණුම් ගත කර නොතිබුණි. තවද, මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දින 03 තුල පවත්වාගෙන ගිය අලෙවිසැල් වෙනින් ලද ආදායම හා අනුග්‍රාහක ලැබීම්ද ගිණුම් වලට නොගෙන අත්හැරී තිබුණි.

1.5.2 පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වෙන් කර තිබූ ප්‍රතිපාදන උපයෝජනය කරමින් වෙනත් ආයතන මගින් දැරූ රු.2,427,693,938 ක පුනරාවර්තන වියදම් මු.රෙ. 208 යටතේ මූල්‍ය ප්‍රකාශන වල වෙනම පෙන්විය යුතු වුවද, එම වියදම් අමාත්‍යාංශය දැරූ වියදමක් ලෙස සලසා ඒ.සී.ඒ. 2 (ii) ආකෘතියේ දක්වා තිබුණි.

1.5.3 මූල්‍ය නොවන වත්කම්

(අ) තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ රු.358,000,000 ක් වටිනා ගොඩනැගිල්ලක් සහිත ඉඩම, ක්‍රීඩා විද්‍යා ආයතනය හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය ස්ථාපිත කර ඇති ඉඩම්, ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධව ඔවතින ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 03 ක් හා ගොඩනැගිලිවල වටිනාකම, සහ ජාතික ක්‍රීඩා සභාවට අයත් ඉඩම්, ගොඩනැගිල්ල හා යන්ත්‍රෝපකරණ සහ දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය යනාදිය තක්සේරු කොට නිවැරදි අගයන් ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව විගණනය වෙත දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ වත්කම්වල තක්සේරු වටිනාකම ගිණුම් ගත කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) නායකත්ව සංවර්ධන මධ්‍යස්ථාන භූමියේ පවතින දැවමය වටිනාකමක් සහිත වෘක්ෂ හා තැඹිලි, පොල්, අඹ යනාදි කෘෂිකාර්මික වටිනාකමකින් යුත් ශාකවල වටිනාකම හඳුනාගෙන එම වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) විගණන නියදි පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් කුඩා ව්‍යාපාර අංශයේ ප්‍රාදේශිය කාර්යාල වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කරමින් රු.10,787,734 ක ජංගම නොවන වත්කම් මිලදී ගෙන තිබුණද එම වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) කෙරීගෙනයන වැඩ ශේෂය තුළ දීර්ඝකාලීනව පවතින රු.1,067,615,012 ක් වටිනා ව්‍යාපෘති 27 කින් දැනටමත් නිම කළ ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් ඉහත ව්‍යාපෘතිවලින් වෙනත් රජයේ ආයතන හා පාසල්වලට පවරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකිරීමටත් මේ දක්වා අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

1.5.4 මූල්‍ය වත්කම්

ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.19,580 ක ණය ශේෂයක් ද, විශ්‍රාම ගිය නිළධාරියෙකුගේ වර්ෂ 1 කට අඩු කාලයක් තුල පැවති අයවිය යුතු ණය ශේෂය රු.137,740 ක් ද අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන දිනවන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

1.5.5 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ විදුලි ජනන යන්ත්‍ර කාමර ව්‍යාපෘතිය සඳහා 2019 දෙසැම්බර් 26 දින ලබා දී තිබූ වැඩ අත්තිකාරම් මුදලින් රු.15,358,239 ක් වූ අත්තිකාරම් ශේෂය සහ මෙම ක්‍රීඩාංගනයේ මුළුතැන්ගෙය හා ආපනශාලා ගොඩනැගිල්ලේ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබූ රු.5,399,007 ක අත්තිකාරම් ශේෂයක් මෙන්ම කටුගස්තොට ශාන්ත අන්තෝනි විද්‍යාලීය ක්‍රීඩා පිටිය සකස් කිරීම සඳහා 2019 වර්ෂයේ දී ගෙවා තිබුණු රු.9,973,950 ක වැඩ අත්තිකාරම් මුදලක් සහ 2024 වර්ෂය අවසාන වන විටත් නිරවුල් නොවී පවතින රු. 6,028,780 ක ශේෂයද අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

1.5.6 නැන්පතු ගිණුම් ශේෂ

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේ දී ඒ.සී.ඒ. 04 ආකෘතිය යටතේ වූ එක් එක් පොදු නැන්පතුවට අදාල 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය සටහන් කිරීමේ දී වැරදි අගයන් අතුලත් කර තිබීම හේතුවෙන් එම අගයන් හා භාණ්ඩාගාර ආකෘතිපත්‍ර SA – 30 හි සඳහන් ආරම්භක ශේෂයන් අතර රු.41,516,933 ක වෙනසක් පැවතුණු බව නිරීක්ෂණය විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කරමින් නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු සකසාගෙන තිබීම හේතුවෙන් වැය විෂයන් 13 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබූ රු.257,470,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමනින්ම ඉතිරිකරගෙන තිබුණු අතර තවත් වැය විෂයයන් 05 කට අදාල ප්‍රතිපාදනයන් 50% ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයකින් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබීම හේතුවෙන් එම වැය විෂයන්ගේ ප්‍රතිපාදිත මුදල් 100% කින් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වැඩි කරගෙන නිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුලදී භාණ්ඩ හා සේවා ලබාගැනීම් සඳහා පෞද්ගලික බැංකු 2 කින් රු.5,642,275 ක් වටිනා බැංකු ඇපකර 4ක් ලබාගෙන තිබුණු අතර ඒවායින් තුනක ඇපවීමේ කාලය 2025 අප්‍රේල් මස 03 වන දිනෙන් අවසන් වී නිබුණි. එහෙත් 2024 දෙසැම්බර් 31 දිනට ඇපවීමේ කාලය නිමවූ රු.1,522,625 ක් වටිනා ඇපකරයෙන් නිදහස්වීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) බාහිර ආයතනය දෙකක් වෙත නිරවුල් කල යුතුව පැවති රු. 25,796,593 ක බැරකම් නිරවුල් කිරීම සඳහා වසර 03 ක කාලයක් ඔට කටයුතු කර නොතිබුණු අතර ඉන් රු.24,858,873 ක බැරකම් ගිණුම් ගත කර නොතිබුණි.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පවතින ජාතික තරුණ සේවා සභාව වෙත මුදාහැරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අමාත්‍යාංශය වෙත ලද රු.මිලියන 493.52 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 74.20 ක් පමණක් සභාව වෙත ලබා දී තිබුණු අතර ඉතිරි මුදල වන රුපියල් මිලියන 419.32 සභාව විසින් දරන ලද වියදම් වෙනුවෙන් ප්‍රතිපූර්නය නොකර නැවත ජනාධිපති ලේකම් කාර්යාලය වෙත හරවා යවා තිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 රෙගුලාසිය	ඇඹිලිපිටිය දිස්ත්‍රික් රෝහල විසින් 2020 වර්ෂයේදී නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස භාවිත කරන ලද කාලය තුල අස්ථානගත වූ වටිනාකම රු.193,044 ක් වූ භාණ්ඩ වර්ග 05 කට අයත් භාණ්ඩ අයිතම 240 ක්ද, වටිනාකම සොයාගත නොහැකි වූ භාණ්ඩ වර්ග 17 කට අයත් භාණ්ඩ අයිතම 199 ක්ද සම්බන්දයෙන් විගණිත දිනය වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි.
(ආ)	අංක 05/2020 දරන හා 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කලමණාකරන චක්‍රලේඛනයේ 02 (ආ) ඡේදය	අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම ඵලදායී නොවන තත්වයේ පවතින වාහන 03ක් අපහරණය කිරීමට සඳහා අමාත්‍යාංශය වසර 02 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.
(ඇ)	අංක 30 / 2016 දරන හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලනය චක්‍රලේඛනයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් කළ යුතු වුවද රත්නපුර දිස්ත්‍රික්කය කුඩා ව්‍යාපාර අංශය අංක WP – PC 4809 දරණ කැබ් රථයේ අවසන් වරට ඉන්ධන පරීක්ෂාව 2020 සැප්තැම්බර් 08 දින සිදු කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් අතරින් පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය කිරීම සහ දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම යන කාර්යයන් ඉටු කරගැනීමට අමාත්‍යාංශය මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2024 වාර්ෂික ඇස්තමේන්තුව අනුව, ලගාකර ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් ලභා කරගැනීමේ ප්‍රගතිය වාර්ෂික කාර්සාධන වාර්තාවේ ඇතුලත් කර නොතිබුණු අතර ඒ පිලිබඳව තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ රත්නපුර දිස්ත්‍රික්කයට අදාල කුඩා ව්‍යාපාර අංශයේ 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා රත්නපුර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර අංශය විසින් ඉදිරිපත් කළ 2024 ක්‍රියාකාරී සැලැස්ම අනුරූප නොවූ අතර ප්‍රධාන ක්‍රියාකාරකම් 73 ක වාර්ෂික ඉලක්කයන් ලගා කර ගැනීමේ ප්‍රගතිය 70% මට්ටමක පැවතුණි. ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇති වැඩසටහන් 24 ක් ක්‍රියාත්මක කර නොමැති අතර වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපාර ප්‍රවර්ධනය හා මාර්ගගත ව්‍යාපාර විශ්ලේෂණ වැඩ සටහන් 2 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නොතිබුණි. තවද, මොනරාගල දිස්ත්‍රික්කය තුල කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2024 වර්ෂයේදී අනුමත කල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.4,500,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද 2024 දෙසැම්බර් 31 දිනය වන විට රු.3,314,564 ක් පමණක් වැය කර තිබීමෙන් වෙන් කල ප්‍රතිපාදන මුදලින් රු.1,185,436 ක් ඌණ උපයෝජනය වී තිබුණි.

(ඈ) ගම්පහ දිස්ත්‍රික්කය තුල තරුණ සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ සංවර්ධන සහයන් ලබාදීම සඳහා රු.9,800,000ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය ආරම්භයේදී වෙන්කරදී තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකව නොතිබුණි. තව ද, ගම්පහ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කළ වැඩසටහන් 1,747 කින් වැඩසටහන් 883 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර එය අපේක්ෂිත වැඩසටහන් වලින් 50.54% ක් විය.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) අමාත්‍යාංශය විසින් කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම සඳහා රු.12,423,487 ක් ඇස්තමේන්තු කර 2018 මාර්තු 28 දින රු.12,230,761 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 06 කින් නිම කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණු නමුත්, ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි.
තවද, අවස්ථා කිහිපයකදී කොන්ත්‍රාත් කාලසීමාව මාස 20 කින් දීර්ඝ කිරීම, අමතර වැඩ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් විධිමත් අනුමැතියක් ලබා නොගෙන කටයුතු කිරීම, ඛෙරුම්කරණ

ක්‍රියාවලියකට කඩිනමින් යොමු නොවීම සහ මිල විවලනයන් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු විසින් එම තීරණ ලබා දීමට වසරකට වඩා වැඩි කාලයක් ගත කිරීම ආදී කරුණු හේතුවෙන්, එකඟ වූ වටිනාකමට වඩා රු.4,225,610 ක බදු සහිත වටිනාකමක් අමතරව ගෙවා තිබුණි. දුනු වීදීම හා වෙඩි තැබීමේ ක්‍රීඩා සඳහා ක්‍රීඩා පිටිය භාවිතා කළ හැකි තත්ත්වයට මේ වෙන තෙක් පත් කිරීමට නොහැකිවීම යන කරුණු මත අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට, එහි කාර්ය මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර්ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමට අදාලව 2017 සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන රු. මිලියන 606 ක් පමණක් වියදම් කර තිබුණි. තවද, රු. මිලියන 487 ක් වැය කර ඉදිකර තිබූ මීටර් 400 කෘතිම ධාවන පථයේ ස්ථාන කිහිපයක පළුදු වී පැවතීම හා මන්නීරු වෙන් කරන ලද ඉරි මැකී ගොස් තිබීම හේතුවෙන් එම ධාවන පථයේ තරඟ සඳහා සහභාගී වන ක්‍රීඩකයන් අපහසුතාවට පත්වී තිබුණු අතර ක්‍රීඩා සඳහා භාවිතා කල නොහැකි තත්වයේ පවතින පැරණි ධාවන පථය පිහිටි ප්‍රේක්ෂකාගාරයේ වහලය ගැලවී ගොස් තිබුණි. එමෙන්ම රු. මිලියන 34 ක් වැය කර ඇති කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වුවද සම්පූර්ණයෙන් වැඩ නිම වීමට පෙර එම ගිවිසුම අවලංගු කර තිබූ අතර මෙහි විදුලිජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 30ක් වැය කර සියයට 65 ක ඉදිකිරීම් ප්‍රගතියක් පැවතියදී ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබුණි.

(ඇ) 2021 නොවැම්බර් 16 දින ටෙක්නොමෙඩික්ස් ඉන්ටර්නැෂනල් නැමැති පෞද්ගලික ආයතනය වෙතින් රු.248,588,726 ක මුදලකට මානව කාර්යසාධන විද්‍යාගාරය සඳහා උපකරණ සැපයීම, ස්ථාපනය කිරීම, පැවරීම, පුනුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා එම සමාගම හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව අදාළ සමාගම විසින් 2023 ජනවාරි 23 හා 24 දින උපකරණ ස්ථාපනය පමණක් සිදු කර තිබුණු නමුත්, අදාල සේවා කන්ඩායම් ලබාදීමට කොන්ත්‍රාත් ආයතනය කටයුතු කර නොතිබුණි. 2025 අප්‍රේල් 22 දින වන විටත් පරීක්ෂණාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කළ යුතු වුවද, එවැනි අධ්‍යයනයක්ද ක්‍රීඩා වෛද්‍ය ආයතනය සිදු කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුම්ගත දිනය වූ 2021 නොවැම්බර් 16 දින සිට සති අටක කාලසීමාව තුළ ගිවිසුම්ගත පරිදි උපකරණ ස්ථාපිත කිරීම් සිදුකල යුතු වුවද සැපයුම්කරු මාස 14ක් පමණ ප්‍රමාදයකින් පසුව උපකරණ ස්ථාපනය කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි 26.1 අනුව ප්‍රමාද ගාස්තු වශයෙන් එක් සතියකට සියයට 1 බැගින් උපරිම සියයට 10ක් රු. 24,858,873 ක් අය කළ හැකි වුවද ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර එම ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමටද අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. උද්දමනය හේතුවෙන් සියයට 20.09 ක්වූ මිල විවලනයක් වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතනයට අතිරික්තව රු.49,942,321 ක් ගෙවා තිබුණු අතර ඒ අනුව මුලු වටිනාකම රු.273,672,175 ක් ගෙවා තිබුණි. තවද 2024 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව මගින්ද මෙම වත්කම් වල භෞතික පැවැත්ම හා එහි තත්වය පිළිබඳ මේ දක්වා විගණනය වෙත වාර්තා කර නොතිබුණි.

4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5 ක් වන නුවරඑළිය ඉඩමක ඉදිකිරීමට යෝජිතව තිබූ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ණය සැලසුම් ගාස්තු ලෙස යුරෝ

264,492.34 ක් එනම් රු.51,047,021 ක් ගෙවා තිබුණත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුළු වියදම නිෂ්කාර්ය වී තිබුණි. ඊට අමතරව 2023 වර්ෂයේදී මෙම කොන්ත්‍රාත්කරු විසින් යුරෝ 23,026,417.76 ක චන්දි මුදලක් ද ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වන මොරටුව විශ්ව විද්‍යාලය විසින් ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් රු.378,067,000 චන්දි මුදලක් ද ඉල්ලුම් කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා නීතිපති උපදෙස් විමසා තිබුණු ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නීතිමය කටයුතු විසඳී නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය අවලංගු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත් සහ උපදේශන ආයතන විසින් ඉදිරිපත් කල හිමිකම් පෑම අධ්‍යනය සඳහා විශේෂඥ උපදේශනයට සමාලෝචිත වර්ෂය තුල රු.3,648,000 ක් ද ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

4.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවෙන් විගණනය සඳහා ලද තොරතුරු අනුව තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත "ජයගමු" තේමාව යටතේ එළිමහන් කායවර්ධන මධ්‍යස්ථාන 02 ක් ස්ථාපිත කිරීම සඳහා රු.2,000,000 ක මුදලක් ලබා දී තිබු අතර ඉන් රු.1,850,000 ක් නිශ්චිත කාර්යයන් සඳහා වැය කර ඇති බවට අමාත්‍යාංශය විසින් විගණනය වෙත වාර්තා කර තිබුණද ප්‍රාදේශිය සභාවේ ගිණුම් පරීක්ෂාවේදී මෙම මුදල එම කාර්යයන් සඳහා භාවිතා නොකර වසර 5 ක් තිස්සේ නිෂ්කාර්යව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

ක්‍රිකට් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම තුලින් ප්‍රාදේශිය මට්ටමින් ක්‍රිකට් ක්‍රීඩාව ඉහල නංවා කුසලතා සහිත ක්‍රිකට් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 3000 ක් හඳුනා ගැනීමේ අරමුණ ඇතිව රුපියල් මිලියන 1500 ක ප්‍රතිපාදනයන් වෙන් කරවාගෙන තිබුණු අතර මේම ව්‍යාපෘතිය පාසල් 373 ක ක්‍රියාත්මක කිරීම සඳහා ඉන් රු.507,881,121 ක් පමණක් උපයෝජනය කර තිබීමෙන් රු. 992,118,879 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී පැවතුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට භාජනය වූ දිස්ත්‍රික්ක 7 ක පාසල් 99 ක් සඳහා රු.151,939,759 ක ප්‍රතිපාදන මුදාහැර තිබූ අතර ඉන් පාසැල් 35 ක් 2024 අවසාන වන විටත් උපයෝජනය කර තිබුණේ රු.45,421,394 හෝ සියයට 30 ක් පමණි.

(ආ) අනුමැතිය ලබා දී තිබූ නවත් දිස්ත්‍රික්ක තුනක පාසැල් 25 ක් සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.28,703,373 ක වියදම් දරා තිබුණද එම පාසල් වල වැඩ නිම නොකර අතර මග නවතා තිබුණි.

(ඇ) මෙම ක්‍රීකට් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙදී පාසල් වල පවතින මූල්‍ය පහසුකම්, යටිතල පහසුකම්, උපකරණ සහ අවශ්‍යතාවය පිළිබඳ නිසි අධ්‍යනයක් සිදු නොකර මුදල් නිදහස් කර තිබීමෙන් පාසැල් 07 ක් විසින් රු.10,548,736 ක වැය දරා ඉදිකර තිබූ පැති වේකට් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.

(ඇ) පුත්තලම් දිස්ත්‍රික්කයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය සහ පැති විකට සෑදීමේ වියදම 2024 දෙසැම්බර් 31 දිනට රු.5,685,812.86ක් ලෙස දක්වා තිබුණද පාසල් 03 ක ක්‍රීඩා පිටි සංවර්ධන කටයුතු නිමකර නොතිබුණු අතර ඒ සඳහා එකතු වටිනාකම රු.3,317,817.34 ක චෙක්පත් 03 ක් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය නමින් ලියා ගණකාධිකාරි හාරයේ රඳවාගෙන තිබුණි. එහෙත් විගණිත දින වන විට මෙම චෙක්පත් වල වලංගු කාලය ඉකුත් වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුවූ සිවිල් ඉංජිනියරින් ආයතනය වෙත චෙක්පත් නොලියා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය වෙත චෙක්පත් ලිවීම විගණනයට මතභේදයට තුඩු දෙන කරුණක් විය.

(ඉ) විගණනයට අනාවරණය වූ කරුණු අනුව පැති විකට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ පිළිපැදීම් කර තිබුණේද යන්න පිලිබඳව පසු විපරම් නොකිරීම හේතුවෙන් එක් ව්‍යාපෘතියක් සඳහා තොරා ගත් කොන්ත්‍රාත් කරු වෙත තවත් ව්‍යාපෘති ලබා දීම ද කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලංසුපත් කැඳවීමට ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම ද මිල කැඳවීම් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සිදු නොකිරීම ද ක්‍රීඩා පිටි හෝ පැති විකට ඉදිකිරීම සම්බන්ධයෙන් පලපුරුද්දක් නොමැති කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවාගෙන තිබීමද කොන්ත්‍රාත් විවලනයන් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබීමද යන අවිධිමත් ක්‍රියාවන් නිරීක්ෂණය විය.

4.3 ප්‍රසම්පාදනයන්

(අ) නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානයේ අංක 61 නිල නිවස, කුවේණි නේවාසිකාගාර හා සිපෙටිකෝ නිල නිවස අලුත්වැඩියාවේදී ඉටු නොකළ වැඩ සඳහා රු.487,529 ක් ගෙවීම් සිදු කර තිබූ අතර තවද බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණු රු.27,166 ක් ද විය.

(ආ) නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේ බාහිර ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ABT පිටියක් සැකසීම වෙනුවෙන් රු.4,859,000 ක් වියදම් දරා තිබුණද, 2024 දෙසැම්බර් 31 දින දක්වා ABT පිටිය සහ උපකරණ භාවිතයට නොගෙන නිශ්කාර්යයව පැවතුණු බව නිරීක්ෂණය වූ අතර බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණු විශේෂ ගාස්තු සඳහා රු.141,789 ක් වැඩියෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

4.4 වත්කම් කළමනාකරණය

(අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කළ වාහන 17 ක් අමාත්‍යාංශය සතුව භෞතිකව නොතිබුණු අතර එම වාහන මේ වන විට කුමන ආයතන සතුව පවතින්නේද යන්න පිළිබඳව සොයා බලා නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හෝ එම ආයතන වලට පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දී දැනට අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වාහන 03 ක්ද වාරිමාර්ග අමාත්‍යාංශය සතු වාහන 02ක්ද උද්භිත හා සත්වෝද්‍යාන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු අංක PA 9349 දරන වාහනයද මෙතෙක් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන මධ්‍යස්ථාන භූමිය තුල පෞද්ගලික දේපල හා පෞද්ගලික පදිංචිකරුවන් සිටින බැවින් නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට මෙම භූමිය නිරවුල්ව භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) ජනාධිපති ලේකම් කාර්යාලය, වෙනත් අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වෙත තාවකාලිකව මුදා හරින ලද අංක CAF 2536, KE 6296, JO 9554 දරන වාහන 03 ක් නැවත ලබා ගැනීමට හෝ එම ආයතන වලට නීත්‍යානුකූලව අයිතිය පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) අංක PB 9860 දරන රථය අයිතිය පවරා ගැනීමෙන් පසු අලුත්වැඩියා කිරීම සුදුසු බව ඉංජිනේරු වාර්තාවෙන් නිර්දේශ කර තිබුණද එම වාහනයේ අයිතිය පවරා ගැනීම හා අලුත්වැඩියා කිරීමකින් තොරව වර්ෂ 2 කට වැඩි කාලයක් අමාත්‍යාංශ පරිශ්‍රයේ නිශ්කාර්යව ගාල් කර පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) අංක KH 0989 දරන රථයේ එන්ජින් අංකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ පවතින එන්ජින් අංකයට වඩා වෙනස් බැවින් ලියාපදිංචි සහතිකය සංශෝධනය කර වාහනයේ නඩත්තු කටයුතු කළ යුතු බව නිර්දේශ කර තිබුණද, මෙතෙක් කිසිදු නිර්දේශයක් ක්‍රියාත්මක නොකර අමාත්‍යාංශ පරිශ්‍රයේ නිශ්කාර්යව ගාල්කර පැවතුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ 2016 නොවැම්බර් 29 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව රු.6,894,735 මුදලකට නවීන තාක්ෂණය භාවිතා කරමින් දක්ෂතා හඳුනාගැනීමේ ක්‍රියාවලියට උපකාර කිරීම, සියලුම ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, ශාරීරික යෝග්‍යතා ආබාධ සඳහා ප්‍රතිකාර සඳහා යොමු කිරීම සහ අවශ්‍ය විටෙක අදාළ අනෙකුත් සියලුම වෛද්‍ය තොරතුරු සම්බන්ධයෙන් බලයත් නිලධාරීන් සඳහා ක්‍රීඩකයන්ගේ වෛද්‍ය වාර්තා ලබා දීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා මෘදුකාංගයක් සකස් කර තිබුණද එයින් අපේක්ෂිත අරමුණු ආයතනය විසින් ඉටු කරගෙන නොතිබුණි. තවද, පද්ධතිය නිම කිරීමෙන් මාස 06 කින් පසුව නිදහස් කල යුතුව පැවති රඳවා ගැනීමේ ගාස්තු වූ රු. 1,378,947 ක මුදල දින කිහිපයකින් මුදා හැර තිබුණු අතර මෙම මෘදුකාංගය නඩත්තු කිරීම පිළිබඳ ගිවිසුමට එළඹීමට ද අපොහොසත් වී තිබුණි.

(ආ) තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2023.05.16 වන දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සිව දෙනෙකු ගෙන් යුත් කමිටුවක් පත් කර තිබුණි. එහෙත් විගණිත දින දක්වා ප්‍රායොගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළු සහිත අවස්තා නිරාකරණය වන ලෙස සංශෝධනය කිරීමට හා යාවත්කාලීන කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2024 දෙසැම්බර් 31 දිනට තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 2 ක් ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 35 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 1 ක් ද, පැවතුණි. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ සහ තෘතීක

ජුනි	693	369	299	318	58	389		
ජූලි	1080	445	315	93	83	260		
අගෝස්තු	692	395	337	48	167	274		
සැප්තැම්බර්	502	330	314	96	85	204		
ඔක්තෝබර්	1047	409	344	46	57	167		
නොවැම්බර්	597	292	241	12	71	283		
දෙසැම්බර්	573	301	177	14	5	68		
එකතුව	**8650**	**4543**	**4010**	**655**	**1048**	**1917**	**176**	**27**

- **ජාතික හා ජාත්‍යන්තර තරඟාවලී සඳහා වෛද්‍ය ආවරණය**

පාසල් මට්ටමේ සිට ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා පැවැත්වෙන ක්‍රීඩා තරඟාවලී සඳහා සියළු වෛද්‍ය පහසුකම් සැපයීම ක්‍රීඩා වෛද්‍ය ආයතනයෙන් සිදුවේ. ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුමැති වෛද්‍ය නිලධාරීන්, ජාත්‍යන්තර මට්ටමේ ප්‍රථමාධාර පුහුණුව ලත් හෙද නිලධාරීන්, උපස්ථායකයින් හා සම්භාහකයින්ගෙන් යුත් කණ්ඩායමක් මඟින් මෙම සේවාවන් සැපයේ. ඒ අනුව 2024 වර්ෂයේදී ජාතික මට්ටමින් 176 ක් හා ජාත්‍යන්තර මට්ටමින් 27 ක් වශයෙන් වෛද්‍ය ආවරණයන් සපයා ඇත. ජාතික මහා ක්‍රීඩා උළෙල, පාසල් මට්ටමේ ක්‍රීඩා තරඟාවලීන්, තේරීම් තරඟාවලීන් හා ක්‍රීඩා සංගම් හා ක්‍රීඩා සම්මේලන මඟින් පවත්වනු ලබන සියළු ක්‍රීඩා තරඟාවලීන් මීට අයත් වේ.









- **මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීම**

මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තරය ජය ගැනීමට යාමේදී, නූතන තාක්ෂණය හා යාන්ත්‍රණ විද්‍යාව භාවිතයෙන් දියුණු වූ රටවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමඟ තරඟ වැදීමට සිදුවේ. එහිදී ලොව දියුණු නූතන

තාක්ෂණික ක්‍රම ශිල්ප භවිතා නොකිරීම, නූතන තාක්ෂණික යන්ත්‍ර උපයෝගීකර නොගැනීම, මෙරට ක්‍රීඩාවේ දියුණුවට බාදාවක් ව පැවතියත් අංග සම්පූර්ණ මානව කාර්ය සාධන විද්‍යාගාරයක් ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ස්ථාපිත කර ඉහත අහිතකර තත්වයන් ඉවත්කර ගැනීමට දායකවීම.





- **ඉහල දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම.**

මේ සඳහා 2024 වසරේ ඉහළ දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එහි අරමුණ වූයේ ශ්‍රී ලංකාව තුල හදුනා ගත් ඉහල කාර්යය සාධනයක් සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් කායික හා මානසික සෞඛ්‍ය සහ පෝෂණය හා සම්බන්ධ ගැටළු නිසියාකාරව හදුනා ගැනීමත් ඒවාට පිළියම් දීම තුලින් ඔවුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කරමින් ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණයන් සඳහා ඔවුන් දිරිමත් වේ.








ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික සෞඛ්‍ය සම්බන්ධ ගැටළු හඳුනාගනිමින් ක්‍රීඩා අනතුරු හා ආබාධ අවම කරගනිමින් ඔවුන්ගේ උපරිම දක්ෂතා වලට යාමට හැකි පරිදි කායික සෞඛ්‍ය යහපත් මට්ටමකින් පවත්වා ගැනීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මානසික සෞඛ්‍ය සම්බන්ධ ගැටළු හඳුනා ගනිමින් නිසි මානසික සෞඛ්‍ය මගපෙන්වීමක් යටතේ ඔවුන්ගේ උපරිම දක්ෂතා වලට යාමට හැකි පරිදි මානසික සෞඛ්‍ය යහපත් මට්ටමකින් පවත්වා ගැනීම,ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ අවශ්‍යතාවය මත දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය නිවැරදි පෝෂණය නිසි පරිදි ලබා ගැනීමට උපදෙස් දෙමින් සහ පහසුකම් සලසමින් තහනම් උත්තේජක වැනි වැරදි ක්‍රම වලින් දක්ෂතා ඉහල නැංවීමට ක්‍රීඩකයින් පෙළඹීම අවම කර එතුලින් ඔවුන්ගේ උපරිම දක්ෂතා වලට යාමට ඉඩ සලසා දීම හා සංචිත ගතකර ඇති ක්‍රීඩකයන් හට නිසි පරිදි පෝෂණය, පෝෂණවේදීන් විසින් නිර්දේශිත ආහාර සහ පාන මගින් ලබා දීම අධීක්ෂණය කිරීම සහ ආහාර පිළියෙළ කරන පුද්ගලයන් හට නිසි පුහුණුව දෙමින් මහ පෙන්වීම මෙම ව්‍යාපෘතියෙන් සිදු විය.

- **ක්‍රීඩා පාසල් පෝෂණ ව්‍යාපෘතිය.**

මෙරට පාසල් මට්ටමින් ක්‍රීඩාවට පිවිසි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව මූලික දැනුම ලබා දීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කල අතර සමස්ත ලංකා ක්‍රීඩා ජයග්‍රහණ උපරිම ලෙස ලබා ගැනීමට හා පාසල් වල පුහුණු සංචිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා දක්ෂතා වර්ධනය සඳහා දායක වීමට මේ තුළින් හැකියාව ලැබුණි.

තෝරාගත් පාසල් වලට ගොස් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මූලික පෝෂණ විශ්ලේෂණය සිදු ආහාර සම්බන්ධ ගැටළු නිරාකරණය කරදීම, සහ ක්‍රීඩකයන්ට ආහාර සපයනු ලබන පාසල් වල උචිත පරිදි ආහාර වට්ටෝරු සංශෝධනය කර ලබා දීම, මූලික වෛද්‍ය පරීක්ෂණයට බදුන් කර ඔවුන්ගේ ක්‍රීඩා ආබාධ හඳුනා ගැනීම හා එම මොහොතේ ලබාදියහැකි වෛද්‍ය උපදෙස් ලබාදීම සහ විශේෂ වෛද්‍ය පරීක්ෂණ හෝ ප්‍රතිකාර කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රාදේශීය රෝහල් වෙත යොමු කිරීමට මෙහිදී හැකිවිය.




- උතුරු මැද, දකුණ, බස්නාහිර, සබරගමුව හා වයඹ පළාත්වල පාසල් මෙම ව්‍යාපෘතියෙන් ආවරණය කළ අතර සමස්ත ලංකා ක්‍රීඩා ජයග්‍රහණ උපරිම ලෙස ලබා ගත් පාසල් සහ දැනට පවතින ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමට අනුබද්ධව ප්‍රථමයෙන් මාර්ගගත දේශනා මාලාවක් මගින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මෙන්ම, ගුරුවරුන් සහ පුහුණුකරුවන්ගේ ක්‍රීඩා පෝෂණ සහ ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ දැනුම යාවත්කාලීන කරන ලදී.
- ඉන්පසුව තෝරාගත් පාසල් වලට ගොස් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මූලික වෛද්‍ය පරීක්ෂණය සහ මූලික පෝෂණ විශ්ලේෂණයන් සිදු කර ව්‍යාපෘතිය අවසානයේ එම දත්ත භාවිතයෙන් පාසල් **ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පෝෂණය පිළිබඳ මාර්ගෝපදේශ සැකසීමට කටයුතු ආරම්භ කිරීම**.

- **පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.**

ශ්‍රී ලංකාව පුරා ජාතික මට්ටමේ මෙන්ම පාසල් මට්ටමේ පුහුණුකරුවන් 10,000 කට අධික ප්‍රමාණයක් විසිරී සිටී. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිදුවන ක්‍රීඩා අනතුරු බොහෝමයක් වළක්වා ගත හැකි අතර. අනතුරු වැළැක්වීම හා ඒ සඳහා ලබා දිය යුතු ප්‍රථමාධාර සම්බන්ධව පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

ක්‍රීඩා ආබාධ වැළැක්වීමට ගත හැකි විද්‍යාත්මක ක්‍රමවේදයන් සම්බන්ධ දැනුම රට පුරා විසිරී සිටින පුහුණුකරුවන්ට ලබා දීම සඳහා කායික යෝග්‍යතාවය, පෝෂණය, ක්‍රීඩාවට පෙර සිදු කරන වෛද්‍ය පරීක්ෂණ ක්‍රීඩාවෙන් පසු ශරීරය යථාතත්වයට ගෙන ඒමට ප්‍රථමාධාර, ක්‍රීඩා මානසික විද්‍යාව වැනි විෂය ධාරා ඔස්සේ අදියර 03 කින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.




දකුණු පළාත, සබරගමුව පළාත, උතුරු මැද පළාත, ඌව පළාත හා බස්නාහිර පළාතෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුහුණුකරුවන් මේ යටතේ පුහුණුව ලද අතර ඒ අවසානයේ පුහුණුකරුවන් සඳහා ක්‍රීඩාවේ හදිසි තත්වයන් සඳහා මූලික ප්‍රථමාධාර (Basic Sports Emergency Care) සහතික පත්‍රයක් ප්‍රධානය කරන ලදී.




- **ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යා පර්යේෂණ පැවැත්වීම**

ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාලව ක්‍රීඩා වෛද්‍ය විද්‍යා පර්යේෂණ පැවැත්වීමේ ව්‍යාපෘතිය මේ සඳහා ක්‍රියාත්මක කල අතර 2024 වර්ෂයේ පර්යේෂණ සඳහා ප්‍රවේශයක් ලබා ගත් අතර පර්යේෂණ හතරක් ආරම්භ කිරීමට හැකි විය.





පර්යේෂණවලට අදාලව පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දත්ත ලබා ගැනීම සිදු කල අතර ඒ ආශ්‍රයෙන් පර්යේෂණ සිදු කිරීමට නියමිතය.

අභියෝග -

- ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ සේවා පුළුල් කර ගැනීම සඳහා ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයේ පැවතිය යුතු අත්‍යවශ්‍යම තනතුරු කිහිපයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමතකර ගැනීම.
- ඵලදායි සේවාවක් ලබා දීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය තුළ ඇති ආයතන සමඟ කටයුතු කිරීමට උත්සාහ කරන අතර සියළුම ආයතන එක් අරමුණක් සඳහා ක්‍රියා කිරීම තුළින් ආයතන වශයෙන් මෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශයේ අරමුණු ජය ගැනීම.

ඉදිරි ඉලක්ක

- ක්‍රීඩා වෛද්‍ය ආයතනය මඟින් ලබාදෙන සේවාවන් ගුණාත්මක භාවයෙන් පවත්වා ගෙන යාමට සහ නූතන වැඩි දියුණු තාක්ෂණය යොදා ගැනීමට හා ආයතනයේ සේවයේ නියුතු සියළු වෘත්තිකයින් තෘප්තිමත් භාවයෙන් තබා ගැනීමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය හැකි ඉක්මනින් ආදායම් උත්පාදනය කරන ආයතනයක් ලෙස ස්ථාපනය කිරීම.

- ක්‍රීඩා හා ව්‍යායාම විද්‍යාව හා සම්බන්ධ ආයතන හා මෙරට විශ්ව විද්‍යාල හා එක්ව අවබෝධතා ගිවිසුම් ඇතිකර ගෙන එම විද්‍යාර්ථයින්ගේ සහයෝගය ඇතිව මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ගුණාත්මක බව වැඩි කිරීම හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා පර්යේෂණ සිදු කිරීම.

- ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාව සම්බන්ධ සම්මන්ත්‍රණයක්/වැඩමුළුවක් පැවැත්වීම තුළ ක්‍රීඩා ක්ෂේත්‍රයේ විද්‍යාඥයින්ගේ දැනුම ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණු කරුවන්ට ලබා දී විද්‍යාත්මක හා තාක්ෂණික යෙදවුම් වැඩි දියුණු කිරීම මත තව දුරටත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ පර්යේෂණයන් වැඩි දියුණු කිරීමට පර්යේෂකයින් දිරි ගැන්වීම.

- ක්‍රීඩා සම්භාහක පාඨමාලාව NVQ 4 මට්ටමේ සිට NVQ 5 මට්ටම දක්වා යාවත් කාලීන කර ක්‍රීඩා සම්භාහකයින් පුහුණු කිරීම.

- 2025-2028 සඳහා සකසා ඇති ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ උපාය මාර්ගික සැලැස්මෙහි හඳුනාගත් ඉලක්ක කරා ගමන් කිරීම.

- ක්‍රීඩකයින් වෙහෙසකර ව්‍යායාමවලින් පසු ඉක්මනින් යථාතත්වයට පත් කිරීම සඳහා ක්‍රීඩා වෛද්‍ය ආයතනය තුළ රිකවරි ඒකකයක් හා හයිඩ්‍රොතෙරපි ඒකකයක් ස්ථාපනය කිරීම.

- ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම.

- ක්‍රීඩා ක්ෂේත්‍රයේ ආරක්ෂාකාරී බව තහවුරු කර ගැනීමට අවශ්‍ය දැනුම,සම්පත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලී පුහුණු කරුවන් හට ලබා දීම හා ඒ සඳහා අවශ්‍ය නීති, මාර්ගෝපදේශ සැකසීම.

- ක්‍රීඩා ක්ෂේත්‍රයේ රැකියාවල නිරත වුවන් නියාමනය කිරීම, දැනුම ප්‍රවර්ධනය හා ලියාපදිංචිය සඳහා නීති රෙගුලාසි ඇතුලත් ක්‍රමවේදයක් සැකසීමට ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.



ආයතන ප්‍රධානි

නම - වෛද්‍ය ජී.එල්.කේ.ඒකනායක

තනතුර - අධ්‍යක්ෂ ජනරාල්(වැ.බ.)

දිනය - 2025/02/18

03. වන පරිච්ඡේදය

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

අමාත්‍යාංශයේ ගිණුම තුළ ඇතුළත්වේ.

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම පදනම්ව)

විශේෂිත දර්ශක	**අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම**		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
වර්ෂයකදී සේවාවන් සඳහා පැමිණි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව		√	
හදිසි ප්‍රතිකාර,හා බාහිර රෝගී අංශයෙන් සපයන ලද සේවා ප්‍රමාණය		√	
පුනරුත්ථාපන අංශයෙන් සපයන ලද සේවා ප්‍රමාණය	√		
කායික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම	√		
දේශීය හා විදේශීයව සිදුකල ආවරණ සංඛ්‍යාව	√		
ක්‍රීඩා පෝෂණ සේවා සැපයීම	√		
රසායනාගාර සේවා සැපයීම	√		
Construction of Human Performance Laboratory			

05. වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	ක්‍රීඩා අනතුරුවලින් තොර ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම	වෛද්‍ය ආවරණ හා වෛද්‍ය සේවා සැපයීමේ ප්‍රමාණය			√
සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ හා තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනයට හා නිරෝගීකම රැක ගැනීම සඳහා අවශ්‍ය පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම	පාසල් හා ජාතික/ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ලබා දුන් ආහාර වට්ටෝරු හා පවත්න ලද දැනුවත් කිරීමේ වැඩමුළු ප්‍රමාණය		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

- තිරසර සංවර්ධන අරමුණු / ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ආයතනයේ ක්‍රියාකාරී සැලසුම් සකස්කර මෙරට ක්‍රීඩාවේ ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ ළඟාකර ගැනීමට කටයුතු කිරීම.

- තිරසර සංවර්ධන අරමුණු / ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාව භාවිතා කිරීම.

06. වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	10	04	06
තෘතීයික	04	03	01
ද්විතීයික	21	17	04
ප්‍රාථමික	41	36	05

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

පාසල් මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටම දක්වා මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ වෛද්‍ය ආවරණය සලසනු ලබන එකම ආයතනය වශයෙන් එම ක්‍රීඩකයින් වෙත උපරිම සේවාවක් සැපයීම සඳහා පුහුණු මානව සම්පත් හිඟය හා හඳුනාගෙන ඇති අත්‍යවශ්‍ය තනතුරු ආයතනය සඳහා අනුමත කර ගැනීමට නොහැකි වීම අහිතකර ලෙස බලපා තිබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.00)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
බාහිර ප්‍රථමාධාර රාජකාරි සඳහා සහභාගී වන නිලධරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහන	34	දින 01	39,000.00		දේශීය	දැනුම යාවත් කාලීන කර ගැනිම.
කාර්ය මණ්ඩලය සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්බන්ධව පුහුණු වැඩ සටහන	38	දින 01	3000.00		දේශීය	නිලධාරීන් දැනුවත් වීම.
පෞද්ගලික ලිපි ගොණුවක් ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම	01	දින 01	5000.00		දේශීය	පෞද්ගලික ලිපි ගොණුවක් ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාමේ

						දැනුම
ප්‍රසම්පාදනය හා විගණනය	12	01	23,890.00		දේශීය	දැනුම වර්ධනය කර ගැනීම
රාජ්‍ය නිධාරීන්ගේ වැටුප් සකස් කිරීම	02	02	10,000.00		දේශීය	දැනුම වර්ධනය කර ගැනීම
කාර්යාල සහායකයින්ගේ යුතුකම් හා වගකීම්	03	02	30,000.00		දේශීය	ගුණාත්මක සේවාවක් සැපයීම
රියදුරන්ගේ කුසලතා වර්ධනය	02	02	20,000.00		දේශීය	ගුණාත්මක සේවාවක් සැපයීම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	10	25,000.00		දේශීය	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම
මූලික ගබඩා කළමනාකරණය	01	02	10,000.00		දේශීය	ගබඩාකරණ දැනුම
රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව	01	අවු.01	75,000.00		දේශීය	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම
නායකත්ව සංවර්ධනය	01	01	5000.00		දේශීය	නායකත්ව සංවර්ධන දැනුම

2024 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන වෙනුවෙන් ලැබී තිබුණේ රු.ලක්ෂ පහක් පමණි. එය ආයතනයේ මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රමාණවත් නොවේ.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.6	වෙනත්	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය	අනුකූල වේ	-	

	යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම	අනුකූල වේ	-	
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා	අනුකූල වේ	-	

	යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ	-	
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	

12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්යය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ	-	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
16	**මානව සම්පත් කළමනාකරණය**			

16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ	-	
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	-		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇඟයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	-		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛ යේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	



ජාතික ක්‍රීඩා විද්‍යායතනය

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

01.වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ක්‍රීඩා පාසල නමින් 1979 වර්ෂයේදී ආරම්භ වූ මෙම ආයතනය 1998 වර්ෂයේදී විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ලෙස ස්ථාපිත කරන ලදී . ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වෙමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ප්‍රබල දායකත්වයක් ලබාදෙමින් ක්‍රීඩා දැනුම සමාජගත කිරීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටු කරනු ලබයි.

දේශීය සහ ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ළඟා කර ගැනීමට දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම මෙන්ම ක්‍රීඩාවේ විවිධ ස්ථරයන්ගේ මානව සම්පත් සංවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ක්‍රියාශීලී දිවිපෙවෙතක් උරුම කර දීමට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කෙටිකාලීන හා දිගුකාලීන උපායමාර්ග සහ සැලසුම් තුළින් අරමුණු කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"ක්‍රීඩා අධ්‍යාපනයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආයතනය වීම."

මෙහෙවර

"ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ගේ නිපුණතා, ශාක්‍යතා, දක්ෂතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යාපනය ලබාදීම සහ පර්යේෂණ පැවැත්වීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම."


අරමුණු

1. ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනාගෙන ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම සඳහා පාඨමාලා නිර්මාණය කිරීම ,සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම.
2. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාල වන පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. ක්‍රීඩා අධ්‍යාපනයේ සංවර්ධන ප්‍රමිතිකරණය සඳහා අවශ්‍ය විශේෂඥතාව කාලීනව විධිමත් කිරීම හා මෙහෙයවීම.
4. නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය මට්ටමින් ලබාදීම අරමුණු කර ගනිමින් කෙටිකාලීන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් මඟින් නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය ප්‍රදේශ වෙත ගෙනයාම.

1.3 ප්‍රධාන කාර්යයන්

#	කාර්යය	ඉලක්ක කණ්ඩායම
01	1.අංක 1973/25 දරණ ක්‍රීඩා පනතේ විධිවිධාන වලට අනුව මෙන්ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ IV, NVQ V, NVQ VI) සඳහා අනුකූල වන පරිදි ක්‍රීඩා පාඨමාලාවන් පැවැත්වීම. උසස් පුහුණුකරු පාඨමාලාව (NVQ VI) ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ V) ශරීර සුවතා උපදේශක පුහුණු පාඨමාලාව (NVQ IV) 2. ක්‍රීඩා කළමණාකරනය, ක්‍රීඩා අභාධ කලමණාකරනය ඇතුළු ක්ෂේත්‍ර ආවරණය කරමින් ක්‍රීඩා පාඨමාලා/ පුහුණු වැඩසටහන් වැඩසටහන් පැවැත්වීම.	පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන උපගුරුවරුන්, ආරක්ෂක අංශයන්හි ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්, ජාත්‍යන්තර සහ ජාතික මට්ටමෙන් තරඟ කල ක්‍රීඩකයන්, ක්‍රීඩා මාධ්‍යවේදීන්.
02	ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම	ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවයන්.
03	ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම	ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම ආයතන.
04	ශරීර සුවතා වැඩසටහන් පැවැත්වීම	ශරීර සුවතාව හා ඒ පිළිබඳ දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන රාජ්‍ය නිලධාරීන් ඇතුළු මහජනතාව .
05	ක්‍රීඩා සේවයේ නිලධාරීන් සඳහා කාර්යාක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු වල පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන්.
06	ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කුසලතා ආකල්ප සංවර්ධනය කර ඔවුන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම	සියළුම ජාතික ක්‍රීඩා සංගම් හා ඊට අයත් පුහුණුකරුවන්.
07	අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා කාර්යාක්ෂමතා කඩඉමක් ලෙස ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම.	අධ්‍යාපන අමාත්‍යාංශයට බඳවා ගත් නවක ක්‍රීඩා පුහුණුකරුවන්.
08	ත්‍රිවිධ හමුදාවල සහ පොලීසියේ නිළධාරීන් පුහුණුකරනු ලබන ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම	ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්.
09	පාසල් ළමුන්ගේ 13 වසරක අධ්‍යාපනය සහතික කිරීම සඳහා පවත්වනු ලබන NVQ IV මට්ටමේ ක්‍රීඩා පාඨමාලාව	උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් නොමැති ක්‍රීඩාව කෙරෙහි දක්ෂතා ඇති පාසල් සිසුන්.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ SL 1
කථිකාචාර්ය
SL 1 - 06
ලේඛකාධිකාරී
MN 7 - 01
සංවර්ධන නිළධාරී
MN 4 -09
සහකාර
කථිකාචාර්ය
MN 7 - 08
භාෂා පරිවර්තක
MN 6 - 01
තොරතුරු තාක්ෂණ
නිලධාරී MN 6 - 01
පුස්ථකාලයාධිපති MN
3 - 01
කළමනාකරණ
සහකාර
ක්‍රීඩා උපදේශක
MN 4 - 10
නේවාසිකාගාර පාලිකා
MN 1 - 01
ප්‍රදර්ශක
MT 1 - 02
ප්‍රදර්ශක MT 1 - 02
රියදුරු
PL 3 - 02
කාර්යාල කාර්ය සහායක
PL 1 – 05

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

ආයතනය තුළ පිහිටුවා ඇති අංශ

පරිපාලන අංශය

ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අභ්‍යන්තර පාලන කටයුතු මෙම අංශය මඟින් සිදුකෙරේ.

පාඨමාලා අංශය

ආයතනය මඟින් පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලාවන්හි සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් ඉටුකෙරේ.

පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමේ අංශය

ශ්‍රී ලංකාවේ සියලු පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමට අදාළ කාර්යන් මෙම අංශය මඟින් ඉටුකෙරේ.

පුස්තකාලය හා ඊට අදාල සේවා සැපයීමේ අංශය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ක්‍රීඩා පුස්තකාලයක් ලෙස ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ පුස්තකාලය හැඳින්විය හැකිය. මෙම පුස්තකාලය මඟින් e-book සේවාව, ක්‍රීඩාවට අදාළ සංයුක්ත තැටි පිටපත් ලබා දීමේ සේවාව, පුවත්පත් හා ග්‍රන්ථ බැහැර දීමේ සේවාව, ක්‍රීඩා සම්පත්දායක තොරතුරු ලබාදීමේ සේවාව, e- Library Friend සේවාව සහ e- News Papers සේවාවන් ලබා ගත හැකිය.

පරිගණක අංශය

ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවන්ට අදාලව පරිගණක දැනුම අභ්‍යාසලාභීන් වෙත ලබාදීම සඳහා පරිගණක අංශය උපයෝගී කර ගනී.

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේනම්) - නැත

02 . වන පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

1.පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් සහ ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා විශේෂ ක්‍රීඩා පුහුණු වැඩසටහනක් 2024.05.20 දින සිට 22 දින දක්වා පැවැත්වීමට හැකි විය.





පුහුණු වැඩසටහනේ විශේෂ අවස්ථා

2.මුහුදු වෙරළ භාවිත කරමින් ක්‍රීඩාවට අවශ්‍ය වන ශක්තිය හා යෝග්‍යතාව දියුණු කර ගැනීම පිළිබඳව පුහුණුකරුවන් වෙත ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීමට හැකි විය. මෙම වැඩසටහන මාතර වෙරළ තීරය භාවිත කරමින් 2024.06.26 දින සිට 2024.06.29 දින දක්වා පවත්වන ලදි.

පුහුණු වැඩසටහනේ විශේෂ අවස්ථා





03.ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.05.07 දින ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදි.



- **පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ප්‍රධාන කාර්ය්‍යයක් වන්නේ ක්‍රීඩා පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම වන අතර 2024 වර්ෂයේ දී පවත්වන ලද පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ .

	පාඨමාලාව/වැඩසටහන	**ඉලක්ක කණ්ඩායම**	**අභ්‍යාසලාභීන් ගණන**
1	ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා NVQ 5	දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩකයින්, ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසල්හි ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ආරක්ෂක අංශ වල ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්	39
2	ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව (සති අන්ත)	අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් ක්‍රීඩා පුහුණුකරුවන්	110
3	ශරීර සුවතා උපදේශක පුහුණු පාඨමාලාව NVQ 4	ශාරීරික සුවතා උපදේශකයින්, ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ස්වේච්ඡා උපදේශකයින්	80
4	ස්වායු ව්‍යායාම උපදේශක පුහුණු පාඨමාලාව	ස්වායු ව්‍යායාම උපදේශකයින් සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ෂවයන්	42
5	ක්‍රීඩා මනෝවිද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	ක්‍රීඩා මනෝවිද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ෂවයන්	25
6	පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - කරාතේ	කරාතේ පුහුණුකරුවන්	31


7	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - ජීවිත ආරක්ෂන, රගර්, පැසිපන්දු	අදාල ක්‍රීඩාවන්හි ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචිවූ පුහුණුකරුවන්. (ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මෙම එක් දින වැඩසටහන පැවැත්වේ	83
8	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (පිහිණුම්)		110
9	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (මලල ක්‍රීඩා)		29
10	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (පාපන්දු, වොලිබෝල්)		99
11	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (ටයිකොන්ඩෝ)		55
12	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (කඹ ඇදීම)		38
13	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (මේසපන්දු)		32
14	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (බොක්සිං, බේස්බෝල්)		06
15	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (මලල ක්‍රීඩා - දෙවන කණ්ඩායම)		25
16	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (සියළුම ක්‍රීඩා)		10
17	වෙරළ ක්‍රීඩා පුහුණු වැඩසටහන	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	52
18	පාසල් ක්‍රීඩා පුහුණු වැඩසටහන	පාසල් ක්‍රීඩා පුහුණුකරුවන්, ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්	65
19	ඉහල උන්නතාංශ ක්‍රීඩා පුහුණු වැඩසටහන	ක්‍රීඩා පුහුණුකරුවන්	58
20	දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන් - දිස්ත්‍රික් 12ක් සඳහා පුහුණු වැඩසටහන් 11ක් පවත්වා ඇත	ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන්	582
	පුහුණුකර ඇති / දැනුම ලබාදී ඇති සමස්ත පිරිස		**1571**

2.3 අනාගත අරමුණු

1. 2028 වර්ෂයේදී පැවැත්වීමට නියමිත ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ පරිසාධන මට්ටමට ලඟාවිය හැකි ක්‍රීඩා පුහුණුකරනු ලබන පුහුණුකරුවන්ට නව තාක්ෂණික දැනුම ලබාදෙමින් අදාල ඉලක්ක වෙත ලඟාවීමට විදේශ සම්පත්දායකයින් යොදාගනිමින් කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

2. 2026 වර්ෂයේ දී ආසියානික සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල වලදී පදක්කම් ජයග්‍රහනය කළ හැකි ක්‍රීඩාවන් ඉලක්ක කර ගනිමින් උසස් පුහුණු පාඨමාලාවන් පැවැත්වීම.

3. ව්‍යායාම් මධ්‍යස්ථානයන්හි පුහුණු උපදේශකයින් සහ ඒ පිළිබඳ උනන්දුවක් ඇති පාසල් හැරගිය තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපලට අවතීර්ණ වීමට හැකි වන පරිදි ව්‍යායාම සහ එම උපකරණ භාවිතය පිළිබඳව නිවැරදි දැනුම ලබාදීම වෙනුවෙන් පුහුණු පාඨමාලා පැවැත්වීම .



ජී.එල්. සජිත් ජයලාල්
අධ්‍යක්ෂ

03. වන පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

අමාත්‍යාංශයේ ගිණුම් තුළ ඇතුළත්වේ.

04. වන පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
Sports Re-Engineering Project (පැවැත්වූ පුහුණු පාඨමාලා සංඛ්‍යාව)		88%	

05 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% -74%	75%-100%
04. සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.	සැමට ක්‍රීඩා අධ්‍යාපනය පහසුවෙන් ලබාදීම සඳහා 2024 වර්ෂයේ සැලසුම් කර ඇති පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම	2024 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කර තිබූ පාඨමාලා සහ පුහුණු වැඩසටහන් වලින් 31ක් පැවැත්වීම			88

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

නැත

06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	**07**	01	06	-
තෘතියික	**11**	03	08	-
ද්විතියික	**29**	19	10	-
ප්‍රාථමික	**07**	04	03	-
එකතුව	**54**	27	27	-

6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පවතින ඌනතාවය අයතනය මඟින් පවත්වනු ලබන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සඳහා බලපෑම් ඇති කරනු ලබන අතර ඒ හේතුවෙන් වැඩි වශයෙන් බාහිර දේශකයන්ගේ සේවය ලබා ගැනීමට ආයතනයට සිදුව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
සිවිල් විශ්‍රාම වැටුප් ගණනය කිරීම හා ගෙවීම් කිරීම.	01	2024.01.31,2/1	දේශීය	විශ්‍රාම වැටුප් ගණනය කිරීම හා ගෙවීම් කිරීම පිළිබඳ දැනුම
රියදුරු හා කාර්යාල කාර්ය සහායකයින් සඳහා විනය හා කාර්යාලීය ආචාරධර්ම.	04	2024.02.15-16	දේශීය	සේවක විනය හා ආචාරධර්ම සමඟින් යහපත් කාර්යාල පරිසරයක් පවත්වාගෙන යාම
මහජන ප්‍රසම්පාදන වැඩමුළුව	01	2024/04/03,04	දේශීය	ප්‍රසම්පාදන පිළිබඳ දැනුම
ක්‍රීඩා පුහුණු හා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	2024/07/3-16 2024/08/21-9/03	දේශීය	ක්‍රීඩා පුහුණු හා සංවර්ධනය පිළිබඳ
Advanced Microsoft Excel	02	2024/07/03,10,17	දේශීය	Advanced Microsoft Excel භාවිතය පිළිබඳ දැනුම
ප්‍රථමාධාර පුහුණු වැඩමුළුව	05	2024/07/26-28, 2024/09/13,14,15,28,29	දේශීය	ප්‍රථමාධාර ලබාදීම පිළිබඳ දැනුම
Olympic Solidarity Administration Course 2024	01	2024/10/10,13	දේශීය	ක්‍රීඩාවේදී සහයෝගීතාව සහ පරිපාගනය පිළිබඳ දැනුම

07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ			
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම්ගිණුම			
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)			
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩපත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම			
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.1	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී	අනුකූල වේ		

	තිබීම			
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම			
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විභණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම			
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම			
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම			
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදී වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම් වලට ඵලශීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම			
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම			
13	**පොදු තැම්පත් ගිණුම**			

13.1	කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම			
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම			
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම			
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම			
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම			
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදී, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		